# සිංහල භාෂාව කෙරෙහි ද්‍රවිඩ භාෂාවේ බලපෑම සෙල්ලිපි ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සෙල්ලිපි කිහිපයක් ඇසුරින්)

ඩබ්. ඩී. ලක්මිණී*

සිංහල භාෂාව වූ කලී ආර්ය භාෂාවන්ගේ ආභාසය ලබමින් දියුණුවට පත් වූවකි. ඒ අතර ද්‍රවිඩ භාෂාව මූලිකත්වයක් ගනු ලබයි. අතීතයේදී සිදුවූ ආක්‍රමණ හා සංක්‍රමණ මේ සඳහා හේතුවන්නට ඇත. එකී සියලු බලපෑම්හි ප්‍රතිඵලයක් ලෙස සිංහල භාෂාවට ද්‍රවිඩ භාෂාවේ බලපෑම ලැබුණා ද යන්න අධ්‍යයන ගැටළුව කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන අතර එහිදී ශිලාලේඛන ඇසුරින් සිංහල භාෂාව කෙරෙහි ද්‍රවිඩ භාෂාවේ බලපෑම කෙබඳු ද යන්න අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වෙයි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් ශිලා ලේඛන සංග්‍රහ ද ද්විතියීක මූලාශ්‍ර වශයෙන් මේ සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙන වෙනත් කෘතිද අන්තර්ජාලය ද භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. අධ්‍යයන සීමාව වශයෙන් හතරවන මිහිඳුගේ මිහින්තලා පුවරු ලිපිය, පස්වන කාශ්‍යපගේ  අනුරාධපුර ලිපිය, බදුලු ටැම් ලිපිය, වේවැල්කැටිය ලිපිය ආදිය යොදාගැනේ. අතීතයේ සිට ශ්‍රී ලංකාව කෙරෙහි ඇති වූ ද්‍රවිඩ බලපෑම , විවිධ ද්‍රවිඩ ශබ්ද සිංහලයේ ව්‍යවහාරයට පැමිණ ඇති අයුරු ඇතැම් සිංහල ශිලා ලේඛනවලට එකතු වී ඇති දෙමළ වචන හා වාග් රීතිවලින් ද හෙළිවන්නේය. "කුඩීන්", "මිඩි", "පාට්ට", "පදි" හා  "කණක්කර්" ආදීහු ද්‍රවිඩ ප්‍රකෘතිය "කුඩීන්" යන වචනය හතරවන මිහිඳුගේ මිහින්තලා ලිපියෙහි ද, වේවැල්කැටිය ලිපියෙහි ද, පස්වන කාශ්‍යපගේ ලිපියෙහි ද හා බදුලු ලිපියෙහි ද දක්නට ඇත. "කුඩීන්" යන්න බදුලු ලිපියෙහි ගම්වැසියන් යන්න අරුත් ගැන්වේ. "මිඩි" යන වචනය හතරවන මිහිඳු රජුගේ මිහින්තලා ලිපියේ සඳහන් වේ. "මිඩිවැජැරුමක්හට්" යනු එහි එන පාඨයකි. දාසීනට කටයුතු සංවිධානය කරන්නා යනු එහි අර්ථයයි. "මෙයිකාප්පර්" යනු ද්‍රවිඩ භාෂාවෙන් බිඳී ආවකි. අංගාරක්ෂකයා යන්න එහි අර්ථයයි. හතරවන මිහිඳු ගේ වේවැල්කැටිය ලිපියේ "යමරවැඩියේ සිට්වනු කොට් ඉසා" යැයි සඳහන් වේ. යකඩ සෙරෙප්පුවෙහි සිටවීම පිණිස යනු එහි අර්ථයයි. සිංහල මරවැඩියේ යනු දෙමළ "මරවඩි" යන්නෙන් තත්භව වූවකි. මරවඩි යන්න පසුකාලයෙහි "මිරිවැඩි" බවට පත්විය. මේ අනුව මෙම ශිලා ලේඛන අධ්‍යයනයේදී ද්‍රවිඩ භාෂාවේ බලපෑම ලැබුණු බව නිගමනය කළහැකිය.

ප්‍රමුඛ පද :- ශිලාලේඛන ,  කුඩීන් , ද්‍රවිඩ , ප්‍රාථමික මූලාශ , ද්විතියීක මූලාශ

* සිංහල අධ්‍යයනාංශය - කැලණිය විශ්වවිද්‍යාලය deepikalakmini1@gmail.com